ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට.

THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

ප්‍රසම්පාදන දැන්වීම

## කුඩා පරිමාණ ගොවියන් සඳහා ගබඩා පහසුකම් ඉදිකිරීම

01. කොවිඩ් 19 වසංගත තත්වය තුළ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය සඳහා සහය ලබා දීමට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හදිසි ආපතිකතා ප්‍රතිචාර සංරචකය (CERC) යටතේ ණය ආධාර ලැබී ඇත. දිවයින පුරා කුඩා පරිමාණ ගොවීන් සඳහා ගබඩා පහසුකම් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ මෙම ණය මුදල සුදුසුකම්ලත් ගෙවීමක් ලෙස ඉදිරියට ගෙනයාමට කෘෂිකර්ම අමාත්‍යාංශය අදහස් කරයි.

02. ලංසු කැඳවීම, ලෝක බැංකුව මගින් අනුමත ජාතික තරඟකාරිත්ව ලංසු (NCB) පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත. ඒ අනුව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ **"කුඩා පරිමාණ ගොවියන් සඳහා ගබඩා පහසුකම් ඉදිකිරීම"** ව්‍යාපෘතියට අනුව ගබඩා ඉදිකිරීම සඳහා යෝග්‍යතාපූර්ණ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලබයි. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරුවා අසාධු ලේඛනගත නොවී සිටියයුතු අතර වෙබ් අඩවියට උඩුගතකර ඇති වගුවේ ඉදිකිරීම් කටයුතුවලට අදාළ ශ්‍රේණි සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී සිටිය යුතු ය.

එම ඉදි කිරීම් පිළිබඳ තොරතුරු පහත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියට උඩුගත කර ඇත.

| www.hambantota.dist.gov.lk |
|---|

03. උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට ඉහත වෙබ් අඩවියේ දක්වා ඇති පරිදි ලංසුපත් ලබා ගැනීමට 2021.07.12 දින සිට 2021.07.30 දින තෙක් පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා හා 2021.08.02 දින පෙ.ව. 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට පැමිණ **දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට** නමින් ආපසු නොගෙවන ගාස්තුවක් ගිණුම් අංශයේ සරප් වෙත ගෙවා ලබාගත හැකි ය. සම්පූර්ණ කරන ලද ලංසුපත් **2021.08.02** වන දින **ප.ව. 2.30** හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් **"දිස්ත්‍රික් ලේකම් (සභාපති), දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට"** යන ලිපිනයට ලැබීමට හෝ ගෙනවිත් මෙම කාර්යාලයේ ආයතන අංශයේ ඇති ටෙන්ඩර් බහාලනය සඳහා ඇතුළත් කල හැකිය. ලංසුපත් භාරගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් ඉදිරියේ ලංසු පත් විවෘත කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද ලංසු මුද්‍රා තබා **මුල් පිටපත හා අනු පිටපතක්,** යන්න සඳහන්කර එම ලංසුපත් එකම කවරයක බහා ඉහල වම් කෙලවරේ **"කුඩා පරිමාණ ගොවියන් සඳහා ගබඩා පහසුකම් ඉදිකිරීම"** ලෙස නම සඳහන් කල යුතුය.

04. ලංසු 2021 ඔක්තෝබර් 01 වලංගු විය යුතු ය.

05. ලංසු සම්බන්ධ වැඩි විස්තර රජයේ වැඩකරන දිනවල දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයෙන් පැමිණ හෝ 047-2256504 දරණ දුරකථන අංකයට ඇමතීම මගින් ලබාගත හැකිය.

06. ලංසු ඉදිරිපත් කිරිමේදි, කොන්ත්‍රාත්තුවට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි, රාජ්‍ය බැංකුවකින් හෝ පිළිගත් වාණිජ බැංකුවකින් "දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට" නමට නිකුත් කරන ලද **2021.10.29** දින දක්වා වලංගු කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතුය. ලංසුව ඉල්ලා අස්කර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කලහොත් ලංසු සුරක්ෂණය රාජ සන්තක කරනු ලැබේ.

07. ලංසුපත් විවෘත කරන අවස්ථාවේදී ලංසු ඉදිරිපත් කරන්නන් හෝ ඔවුන් වෙනුවෙන් බලය පවරන ලද නියෝජිතයන්ට පැමිණ සිටීමට හැකි වේ. (නියෝජිතයෙකු සහභාගීවන්නේ නම්, ඔහු වෙත බලය පවරනු ලැබූ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.)

ප්‍රසම්පාදන කමිටුවේ සභාපති
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
හම්බන්තොට
2021.07.12